# හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය
# Homagama Central College

71 S I

## ප්‍රථම වාර පරීක්ෂණය - 2026 මාර්තු

සිංහල I | 13 ශ්‍රේණිය (2024-2026) | කාලය පැය 03 යි.

පන්තිය .......................................... නම/විභාග අංකය ......................................................

- පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.)

(අ)

සිටුදුවණියෝ ද සොරුන්ගේ අකුසල් නැමති සතුරාත් සහාය කොට ගෙන සොරු ගලින් හෙළාලා තමන්ගේ කුසල් නැමති මිත්‍රයාණන් සහාය කොට ගෙන තුමූ ගැළවී ගෙන, සිතන්නාහු 'ඉදින් මම ගෙට ගියෙම් නම් තොපගේ ගෙහිහිමියෝ කොයි දැ' යි විචාරති. විචාළවුන්ට මරාපීමියි කීම් නම් "හැයි නොහික්මුණු තැනැත්තිය, දහසක් යවා ගෙන්වාගෙන දැන් මරාපී දැ"යි, එසේත් දොඩති. ඒ මා මරන්ට ගෙන ගිය යි කීම් නම් "එයිත් තොප මරන්ට කාරණ කවරේ දැ"යි නොහදති. කවර ලෙසින් වුවත් ගෙට යාමෙන් ප්‍රයෝජන නැතැ'යි සිතාලා ආභරණ පැලඳ ගෙන තනි ව යාමෙහි ආදීනව සලකා එයිත් එතැන ම දමා වල් වැද අනුක්‍රමයෙන් ඒ ඒ තැන ඇවිදිනී පරිව්‍රාජිකාවරුන් වසන පන්සලකට ගොසින් උන් වැඳලා 'ස්වාමීනි, මා මහණ කළ මැනවැ'යි කිවු ය. උයිත් තමන් මහණ වූ ලෙසින් මහණ කළහ. මහණවලා ම ප්‍රව්‍රජ්‍යාව නම් පුරන ලද ගුණ මූලික ව වන හෙයින් ගුණවිශේෂයක් ලබනු කැමති ව 'ස්වාමීනි, මුඹ වහන්සේගේ අනුශාසනාවෙහි උතුම් කවරේ දැ යි විචාරා 'පරිව්‍රාජිකාවෙනි, කිසුණු පිරියම් කොට ධ්‍යාන හෝ ඉපදවිය යුතු ය. වාද දහසක් හෝ උගත යුතු ය. අපගේ සමයෙහි තෙල දෙක උතුම් ව තිබෙයි' කිවු ය. ස්වාමීනි, ධ්‍යාන උපදවන්ට මට නොපිළිවන. වාද දහස උගනිම්'යි කිවු ය. ඉක්බිති පරිව්‍රාජිකාවරු ද වාද දහස උගන්වලා 'අප දන්නා වාද ඉගෙන නිමවුව. දැන් තොපි දඹදිව්තලයෙහි ඇවිද තොප හා වාද කරන්ට සමර්ථ කෙනෙකුන් බලව'යි උන් අතට දඹ අත්තක් දීලා 'පරිව්‍රාජිකාවෙනි, යව'යි අවසර දී කියන්නෝ 'ඉදින් ගිහි කෙනෙක් තොප හා වාද කටහුණවු නම් උන්ට පාදපරිචාරිකා වව. ඉදින් පැවිදි කෙනෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ළඟ මහණ වව'යි උගන්වා යවූ ය.

i. මෙම පාඨයේ සඳහන් සිටුදියණිය මුහුණදුන් ගැටලුව කුමක්ද?
ii. සිටුදියණිය ගත් බුද්ධිමත් තීරණය කුමක් ද?
iii. "ස්වාමීනි, මුඹ වහන්සේගේ අනුශාසනාවෙහි උතුම් කවරේ දැයි විචාරා" මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. 'කිසුණු පිරියම් කොට' යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)

(ආ)

එසඳ ඒ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව "මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ"යි සිතා සැඟව සිට කිඳුරාට හීයක් විද්දේ ය. ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේ ය. "සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තව ද ආයු ඇති ව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි යි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේ ය. කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියළී ගිය මළ හෝකඳුරක් සෙයින් ජීවිත විනාශයට පැමිණෙන සේ බලව." පර්වතයක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින් ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේ ය. වැළිත් "මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමඟ එක් ව කෙළ ඇවිද ලියමඬුලු වන ලැහැප් අතළ ගල් ගං හිස් ගිරිමුදුන් රුක් යට වැලිතලාදි වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තිගේ අඥෝනාකම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි" යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තෙහි ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය. රජ ද විදි තැන ම සිටියේ ය.

i. බරණැස් රජුගේ සිතුවිල්ල කුමක් ද?
ii. කිඳුරා දුකින් හඬාවැටීමට හේතුව ලෙස දක්වන්නේ කුමක් ද?
iii. "ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තෙහි ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය." මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. "පියසන්" යන යෙදුමට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(ඉ)

මෙසේ සීසානා ගොවියක්හු විසින් පළමුව පලා ගොස් කුඹුරෙහි වනඅත් ගසා ඇළමං පායාපායා ගෙන දෙවනුව ශුභ වූ නකතකින් ගෙවඩා බිම්නගා දෙසී තුන්සී සා මියර කපා කැට තළා පෝරු ගා බිජුවට වඩා විධි වූ පරිද්දෙන් කුඹුරෙහි වපුට ගත මැනව. ඒ වපුළා වූ කුඹුරෙහි සතාසතුන් සතියක් රක්ක මැනව. වැට බැඳ ඉස්නන් නමා එගොයම් නිලන අවස්ථාවෙහි කුඹුර මැද රකවල් පැලක් තබාගෙන මැසිදණ්ඩක් ලාගෙන ගෙයි දී කන බතෙක රස නොදැන ඇඳෙක පිටක් නො තබා රාත්‍රීදිවාභාගයෙහි එක දවසෙකත් නිනිදේ නින්දක් නිඳා නොපියා ගෙරින් මීවුන් ඌරන් මුවන් ආදී වූ සතාසතුන් සාරමසක් රක්ක මැනව. කරලක් නැගූ තෙන පටන්ගෙන පියන්වා ආදි වූ නොයෙක් රෝගයට කෙම්පාන් කමසේ නැති නැතිව කළ මැනව. දවසින් දවසට කුඹුර සිසාරා අතු තබාලුව මැනව. පන් ඇද්ද මැනව. මෙසේ දුක්ගෙන ගොයම් රකිනා කල සීනටිකුඹුරෙක් වී නම් තුන්සාරමසක් රක්ක මැනව. මාවී කුඹුරෙක් වී නම් සමසක් සත්මසක් රක්ක මැනව. මෙදෑතුරෙහි ඇළ අමුණු පුවටා ආදි වූ බොහෝ කර්මාන්ත අතකමසේ නැතිව කළ මැනව. පැසෙන මස මුළුල්ලෙහි බසබරළ වනතුරු හඬග හඬගා කුඹුරෙහි එමුල්ලෙන් එමුල්ලට දිවදිව කමසේ නැතිව කුරුලු කොබෝ ගිරා මොනරු ආදී වූ වී කන සතුන් බිණුව මැනව. ගොයම් පැසුණු කල දා මැඩ අඳ වී නම් අඳයෙන් එකක් දුන මැනව. තුනින් එකක් වී නම් තුනින් එකක් තමා ම තිබාගෙන දුන මැනව. බලාපු වී නම් හැම වී ම වී හිමියන්ට දුන මැනව

i. ගොවියා පැල් රකින විට විඳින දුක්කම්කටොලු මොනවාද ?
ii. ඡේදයට අනුව අස්වැන්න බෙදී යා යුතු ආකාරය කෙසේ විය යුතු ද ?
iii. "ගොයම් රකිනා කල සීනටිකුඹුරෙක් වී නම් තුන්සාරමසක් රක්ක මැනව. මාවී කුඹුරෙක් වී නම් සමසක් සත්මසක් රක්ක මැනව." මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. "දෙසී තුන්සී සා" යන්නට කෙටි විවරණයක් සපයන්න.

(ලකුණු 04 යි)

(ඊ)

මෙසේ අමාත්‍යයාගේ මෙහෙවර අසා ගිය තැනැත්තිය කී ස්වරූපය අසා වෙළඳාණන්ගේ භාර්යාවෝ ස්වභාවයෙන් ම තමන් තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති ව ශ්‍රද්ධාවන්ත හෙයිනුත් පළමු තමන් ශ්‍රමණබ්‍රාහ්මණයන් අතින් බණ ඇසූ හෙයිනුත් "මේ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයාණන්ට ප්‍රයෝජන කිම් ද? එම්බා, මේ ශරීරය මුත්තෙකින් මැණිකෙකින් රනෙකින් රිදියෙකින් නිමියේ නොවෙයි. උත්පලපදුමපුණ්ඩරීකාදීන් අභ්‍යන්තරයෙහි සුවිපවිත්‍ර තැනෙකැ උපන්නේත් නොවෙයි. මච්කුස නැමැති කුණපයෙහි පණුවෙකු මෙන් උපන්නේ ය. එසේ උපන්නා වූ සරාගී පුරුෂ නැමති කුණපය තෙමේ ම තමාටත් වඩා මාතුගාම නැමැති කුණපයෙහි ම ඇලුම් කරන්නේ ය. ඉන්ද්‍රජාලයෙහි පෙනීගිය රූපයක් බඳු වූ අස්ථිර වූ මේ රූපය අඥාන ජනයෝ ස්ථිරසාරදෙයෙකැයි ප්‍රාර්ථනා කෙරෙති. මෙසේ මේ ශරීරය නම් කෙස් ලොම් ආදී වූ දෙතිස් කුණපකොටසින් යුක්ත හෙයින් ඇතුලෙහි කසළ පුරා පිටතැ සිතියම් කළ ප්‍රතිමාරූපයක් හා සමාන ය. පිළිකුල් වූ එ ම ශරීරය අඥාන ජනයන්ට සන්තෝෂ එළවන්නේ ය.

i. මෙහි සඳහන් වෙළඳ භාර්යාව සතු ස්වභාවයෙන් ම පිහිටි උතුම් ගුණාංගය කුමක් ද?
ii. මෙහි ශරීරයේ හටගැනීම පිළිබඳ දක්වා ඇති සඳහන කුමක්ද?
iii. "ඉන්ද්‍රජාලයෙහි පෙනීගිය රූපයක් බඳු වූ අස්ථිර වූ මේ රූපය අඥාන ජනයෝ ස්ථිරසාරදෙයෙකැයි ප්‍රාර්ථනා කෙරෙති." මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. 'දෙතිස් කුණප' යන වචනයට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)

(උ)

සව්සත කුලුණැසින් - සව්සත තියුණු නැණසින්
නිති දක්නා විසින් - එ රජමය යුතු වූයෙ යුගැසින්

සුරත ඔහු යුදයට - සුරත ලෙළ දෙන කගපට
සුරත මිස යුග දිට - සුරත නම් කොද රූපඹුවන් හට

i. මෙහි පළමු පද්‍යයෙහි සඳහන් රූපකාලංකාරයක් උපුටා දක්වන්න.

ii. මෙහි සඳහන් බඹදත් රජු තුළ පැවති උසස් මානුෂීය ගුණාංගය කුමක් ද ?

iii. " සුරත නම් කොද රූපඹුවන් හට" මෙම උධෘතය ලිහිල් බසින් ලියන්න.

iv. 'සුරත' යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- (ඌ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඌ). පහත සඳහන් උධෘත ඇසුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. "විසඳා නිමවාලා තොප විචාරන ප්‍රශ්න මෙතෙක්ම ද? තවත් ඇත්මදැයි විචාළ සේක."

ii. "කිරිබොන තරම් බාලදරුකෙනෙක් කුමක් කෙරෙද්දැයි කියා තමන් බඩ සා වුවහොත් බත් ලවාගෙන කන්ට කියව ."

iii. "මෙතැන්හි නොවසව. පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව යි."

iv. "තෙපි දැන් යම් ස්ත්‍රියක් ප්‍රාර්ථනා කරා නම් ඕ තොමෝ උත්තම ජාතීන් විසින් සහාවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක්ම ය "

v. "අප්පොච්චි ගාව තිබුණා යකුන් බැඳගෙන වැඩගන්නා මන්තරයක්. ඒ මන්තරය ඉගෙන ගත්තේ අල්ලපු ගමේ ටිකිරි බණ්ඩා කියන සිංහල මිනිහෙකුගෙන්.".

vi. "පංච මධුරා දිසාවට යන මගක් - මෙහි ඇති බව නොඇසුවෙමු
වැරදී සලකුණු ඔස්සේ අවුදින් - මංමුළා වූ විලස දිස්වේ"

vii. "නෑ මට හිතෙනවා නෝනා බිස්නස්කාරියක් වෙලා, සර් නේද කලාකාරයෙක් වෙන්න තිබුණේ කියලා."

(ලකුණු 3 × 4 = 12 යි)

(එ). පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයේ කාව්‍ය අනුභූතිය, ආකෘතිය, සංකල්ප රූප හා භාෂාව ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පඩි පෙළින් බැස අයින් වී එන්න
අලුත් මල් පොකුරු අරගෙන එන්න
පින්වතුනි, එන අයට ඉඩ දෙන්න
එපා පරමල් පයින් පාගන්න

බලන් මේ මල්හි පරමල් සුවඳ
කැඩුණු පෙතිවල තිබෙන මුදු මෙළෙක
මහලු මවු කෙනෙකුගේ මුව රැඳුණ
සිනාවක් සේ ප්‍රේමයෙන් පිරුණ

මලානික මල් රේණුවල පෙනෙන
අපරිමිත පැතුම්වල මුහුණුවර
සියදහස් අත්වලින් පුදන ලද
උතුම් මිනිස්කමේ ගුණ සුවඳ
බලන් තවමත් සුවඳ දෙන මහිම

පඩිපෙළින් බැස අයින් වී එන්න
තිබේ පුදසුන හිස්ව ඔබ පිණිස
අලුත් මල් පොකුරු දෝතින් ගන්න
එපා පරමල් පයින් පාගන්න

( පරමල් - රත්න ශ්‍රී විජේසිංහ)

(ලකුණු 12 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(02) (අ) "සිංහල ගද්‍ය සාහිත්‍යයේ ඇති නිර්මාණ කෙරෙහි පාලි සාහිත්‍යය දැඩි බලපෑමක් සිදුකොට ඇති බව දැකිය හැකි ය." දඹදෙණිය, කුරුණෑගල හා ගම්පොළ යුගයන්හි ලියැවුණු ගද්‍ය සාහිත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07 යි)

(ආ) 'කතාවක් රසවත්ව ඉදිරිපත් කිරීමටත් ධර්මෝපදේශ ලබාදීමටත් සද්ධර්මරත්නාවලියෙහි කතුවරයා යොදාගෙන ඇති භාෂාව බෙහෙවින් බල පා ඇත. නියමිත කතා වස්තු ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

අභාව්‍ය, අත්භූත ජනක සිදුවීම් ඇතුලත් කළ ද කතාරසයට හානියක් නොවන සේ රසවත් කතාවක් ගෙනහැරපෑමට පූජාවලිය කතුවරයා පෑ සාමර්ථ්‍යය පූජාවලියෙහි නිර්දිෂ්ට කතා ඇසුරෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 08 යි)

(03) (අ) අතෘප්තිකර ආශාවන් සපුරා ගැනීමට යාම හේතුවෙන් පුද්ගලයින් පරිහානියට පත්වීම හා එබඳු සිදුවීම් පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය ධර්මෝපදේශ යොදා ගැනීම සද්ධර්මාලංකාරයේ කැපී පෙනෙන ලක්ෂණයකි. සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

නැතහොත්

(ආ) ජාතක කතාවන්හි අන්තර්ගත චරිත ප්‍රායෝගික ජීවිතය හා බැඳුණු අවස්ථා පදනම්කරගෙන නිරූපණය කොට ඇත. නිර්දිෂ්ට ජාතක කතා ඇසුරෙන් තහවුරු කරන්න.

(ලකුණු 15 යි)

(04) සරල භාෂාව හා උචිත කාව්‍යෝක්තීන් මැනවින් යොදාගනිමින් විවිධ සිද්ධි හා අවස්ථාවන් වර්ණනා කිරීම ගුත්තිල කාව්‍යයෙහි සාර්ථකත්වයට හේතු වී ඇත. සුදුසු නිදසුන් දක්වමින් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(05) පුද්ගලබද්ධ අත්දැකීම් ඇසුරින් සමකාලීන සමාජය විවරණය කිරීමට නූතන කෙටිකතාකරුවා සමත් වී ඇති ආකාරය නියමිත කෙටිකතා තුනක් නිදසුන් දක්වමින් විවරණය කරන්න.

(ලකුණු 15 යි)

(06) යටත් විජිත යුගයෙහි ලාංකීය ජන සමාජයෙහි පැවති සමාජ පසුබිමත් නිලධාරී පැලැන්තියෙහි අසාධාරණය හමුවෙහි විනාශවන ගැමි ජීවිතත් බැද්දේගම නවකතාවෙන් මැනවින් නිරූපණය කෙරෙයි." බැද්දේගම නවකතාව ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(07)"දේශාභිමානය, සමාජ සංශෝධනය, ළමා සිතුම් පැතුම්, ස්වභාව සෞන්දර්ය, බොදු බැතිය ආදී වස්තු විෂයන් ඇසුරු කරමින් පුරාතන කවිබස, කටවහර, ළමා ලෝකය හා සම්බන්ධ බස යොදාගනිමින් කොළඹ කවියේ ප්‍රථම තරංගයෙහි නිර්මාණ බිහි වී ඇත." නූතන පද්‍ය සංග්‍රහයේ එන පද්‍ය පන්තිවලින් නිදසුන් දක්වමින් මෙම අදහස විස්තර කරන්න.

(ලකුණු 15 යි)

(08) අභාව්‍ය නොවූ මිනිස් හැසිරීම් මැනවින් නිරූපණය කරමින් මානව සිතුවිලි ගැඹුරින් විග්‍රහකිරීමට එදිරිවීර සරත්චන්ද්‍රයෝ සමත් වී ඇත්තාහ. පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය ඇසුරෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
iexamhub

හෝමාගම මධ්‍ය විද්‍යාලයCentral College Homagama

# හෝමාගම මධ්‍ය මහාවිද්‍යාලය
# Homagama Central College

71 | S | II

## ප්‍රථම වාර පරීක්ෂණය - 2026 මාර්තු

**සිංහල II** | **13 ශ්‍රේණිය (2024-2026)** | **කාලය පැ ය 03 යි.**

**පන්තිය ............................................ නම/විභාග අංකය ..........................................................**

උපදෙස්
I කොටසේ 01 ප්‍රශ්නය ද II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
01 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාරදෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 **කණ්ඨජ ඝෝෂාක්ෂරයන්ට අයත්** අක්ෂර පමණක් ඇති වරණය තෝරන්න.
1. ක, ඛ, හ, අ  2. උ, ඣ, ඤ, හ  3. අ, ග, ඝ, හ  4. ඝ, ඣ, ඨ, හ  5. ඉ, ග, ඝ, හ  (.....)

1.2 **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත** පද පේළිය තෝරන්න.
1. උච්ඡාරණය, සමස්තලංකා, උද්ඝෝෂනය, ශූරතාවය, දෘෂ්ටිකෝණය
2. උච්චාරණය, සමස්ථලංකා, උද්ඝෝෂණය, සූරතාවය, දෘෂ්ටිකෝණය
3. උච්චාරණය, සමස්තලංකා, උද්ඝෝෂණය, ශූරතාවය, දෘෂ්ඨිකෝණය
4. උච්ඡාරණය, සමස්තලංකා, උද්ඝෝෂණය, සූරතාවය, දෘෂ්ඨිකෝණය
5. උච්චාරණය, සමස්තලංකා, උද්ඝෝෂණය, ශූරතාවය, දෘෂ්ටිකෝණය  (.....)

1.3 **අකාරාදි පිළිවෙළ අනුව** නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. අනුරාධපුර යුගය, කෝට්ටේ යුගය, කුරුණෑගල යුගය, ගම්පොළ යුගය, දඹදෙණිය යුගය
2. අනුරාධපුර යුගය, කුරුණෑගල යුගය, කෝට්ටේ යුගය, දඹදෙණිය යුගය, ගම්පොළ යුගය
3. අනුරාධපුර යුගය, කුරුණෑගල යුගය, ගම්පොළ යුගය, දඹදෙණිය යුගය, කෝට්ටේ යුගය
4. අනුරාධපුර යුගය, කුරුණෑගල යුගය, කෝට්ටේ යුගය, ගම්පොළ යුගය, දඹදෙණිය යුගය
5. අනුරාධපුර යුගය, ගම්පොළ යුගය, කෝට්ටේ යුගය, කුරුණෑගල යුගය, දඹදෙණිය යුගය  (.....)

1.4 **පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
1. උපසර්ග පද නාමයකට හෝ ආඛ්‍යාතයකට පූර්වයෙන් පමණක් යෙදිය හැකි ය.
2. උපසර්ග පද ලිංග, විභක්ති, වචන ආදියෙහි වරනැඟිය හැකි ය.
3. අභි, උප, න යන පද සිදත් සඟරාවේ හඳුන්වාදෙන උපසර්ග පද විස්සට අයත් වේ.
4. උපසර්ග පද අව්‍ය පද ලෙස ගත නොහැකි ය.
5. උපසර්ග පද, පදයක හෝ වාක්‍යයක ආරම්භයෙහි පමණක් යෙදිය හැකි ය.  (.....)

1.5 **එකිනෙකට අනුරූප වන සේ වචන යුගල** නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.
1. සදහම් චාරිත්‍ර, සොඳුරු සන්ධ්‍යාව, සිරිපා ලාංඡනය, මිනිස් ශරීරය
2. අෂ්ටාංග ශීලය, පූර්ණ ඝටය, උද්‍යාන භූමිය, දුට්ඨ ගාමිණී
3. පරිත්‍රාණ දෙසුම, මැදුම් පිළිවෙත, විසිතුරු දසුන, ද්‍රවිඩ බස
4. දළඳා මැඳුර, විමසුම් ඇස, ස්වභාව දහම, රන් ආභරණ
5. ශක්‍ර දිව්‍යරාජ, සූර්ය මණ්ඩලය, චන්ද්‍ර බිම්බය, ප්‍රාචීන බස  (.....)

1.6 **තත්සම වචන පමණක්** ඇති වරණය කුමක්ද?
1. කල්පාන්ත, මනෝවිද්‍යාව, ප්‍රශස්ත, අභ්‍යවකාශය  2. මුග්ධ, ප්‍රසිද්ධ, බිම, භීතිය
3. දෙවිඳු, ක්ෂීර, කම්කිරිය, සිද්ධාන්ත  4. සාරගර්භ, ශ්‍රී විභූතිය, පඨම, මග
5. අබිමන්, කර්තෘ, සලඹ, ප්‍රෞඪ  (.....)

1.7 **තත්භව වචන පමණක්** අන්තර්ගත වරණය තෝරන්න.
1. සත්, කුඹු, ගඟ, වර්ණය  2. සිත්, සිවුරු, දළ, ඉසි
3. බඹ, ඡත්‍ර, ටැඹ, චක්‍ර,  4. සෑය, සඳුන්, සිරිත්, ඡායා
5. පසිඳු, දෘඪ, ලඹ, පුත්‍ර  (.....)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.8 **විශේෂණ, විභක්ති, අව්‍යය, දකාරාර්ථ** යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1. බුදුබණ, සඳවත, අකුසල්, රැදවල්
2. සඳවත, බුදුබණ, රැදවල්, අකුසල්
3. සඳවත, බුදුබණ, අකුසල්, රැදවල්
4. අකුසල්, බුදුබණ, සඳවත, රැදවල්
5. සඳවත, අකුසල්, රැදවල්, අකුසල් (.....)

1.9 **කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.

1. ගනු, දෙනු, බොනු, යනු, කනු
2. ඉතිරෙන, විසිරෙන, වැගිරෙන, පැතිරෙන, වැතිරෙන
3. වැටීම්, නැඟීම්, හැඬීම් , රැඟීම්, නැසුම්
4. ලියවිලි, කියවිලි, නැටිලි, කැපිලි, කියමන්
5. මළ, කළ, දළ, හළ, වපුළ (.....)

1.10 **එක ම සන්ධි ප්‍රභේදයකට අයත් පද** සහිත වරණය තෝරන්න.

1. ගිරග, රියැදුරු, අරුණලු, ගුණැති
2. දිගැසි, සුරඟන, දෑගසව්, අත්තම්
3. ඇත්තල, කම්මල, පන්නම්, අම්මල්
4. වංමුතු, නෙළුම්මල්, ගංරන්, ඇද්දළ
5. වැල්ලවුරු, දෙවුර, දෑල, පත්තිරු (.....)

1.11 **අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා** අනුපිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

1. බඳින්න, කළඹා, ලියවයි, නට නටා, බලතොත්
2. සිදිත, නැමැදැ, වැටෙමින්, දුවවයි, බලවු
3. නික්මී, ගනින්, කැපි කැපී, අදිද්දී, කපවයි
4. නටවයි, සිතමින්, කියග, මතුට, කියත
5. වැස්සොත්, රකිමින, සෝදවයි, වරෙවු, දැන (.....)

1.12 **තද්ධිත නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

1. නැවියා, සිසිල, බොජුන්, ඉහළ
2. පහත, දොරටු, වරලස්, නෙතු
3. සිරිමත්, පෙම්වත්, සිඟිති, වකුටු
4. රජතමය, නාගරික, භෞතික, ගුණවන්ත
5. පෞරුෂය, ශූරතාව, සෞඛ්‍ය, ඉන්දියානු (.....)

1.13 **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. නිවාස, උපාය, උපමා, ආචාර
2. ආනයන, අවනත, ප්‍රමේය, ප්‍රත්‍යක්ෂ
3. නිකාය, ප්‍රගති, ප්‍රතිමා, පිරිසිදු
4. අතිරේක, සුවහස්, නොහොත්, නිධාන
5. සම්මාන, විහාර, සන්තාප, සම්මති (.....)

1.14 **නිපාතයක් නොවන පදයක්** අන්තර්ගත වරණය තෝරන්න.

1. නමුත්, වස්, හොත්, දු, විට
2. විසින්, ගෙන්, කෙරෙන්, කෙරෙහි, ගේ
3. මෙන්, සේ, එව්, අයුරු, ලෙස
4. එපා, එදා, දවස, ඊයේ, පාසා
5. එම්බල, එම්බා, සැණින්, සෙමින්, නො (.....)

1.15 "**සැවුල්නාදය** අසා **ප්‍රමුදිත** වූ **ධීමත්හු** **සූර්යෝදයෙහි** අසිරිය විඳින්නට පෙළ ගැසුණාහ." යන වාක්‍යයෙහි ඉරිඇඳි පද අයත්වන ව්‍යාකරණ අනුපිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

1. සමාස පද, සන්ධි පද, තද්ධිත පද, උපසර්ග පද
2. උපසර්ග පද, සමාස පද, සන්ධි පද, තද්ධිත පද
3. සමාස පද, උපසර්ග පද, තද්ධිත පද, සන්ධි පද
4. තද්ධිත පද, සමාස පද, උපසර්ග පද, සන්ධි පද
5. උපසර්ග පද, සන්ධි පද, සමාස පද, තද්ධිත පද (.....)

1.16 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. කියන්නී, දොවන්නී, කොටන්නෝ, සිඹින්නී
2. එව, කව, බොව, යවු
3. අතුළ, අඹළ, ගුගුළ, විඳින
4. ගයනුව, කියනුව, හඬනුව, දෙසනුව
5. බලතොත්, සිඳිත, බලද්දී, බදිත (.....)

1.17 **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** වරණය කුමක්ද.?

1. අප්‍රිකානු, මුදුතා, තාරුණ්‍ය, ධර්මඥ
2. දුර්ජන, වර්ණනා, නිර්ව්‍යාජ, නිර්දෝෂ
3. විකෘති, සංස්කෘති, උද්ගත, උත්පත්ති
4. තිදොර, තරුපති, ප්‍රබල, වනමල්
5. ලියවිලි, රැකුම්, රඟන, බිඳුණු (.....)

1.18 **අවධි, සම්බන්ධ, සම්ප්‍රදාන, කරණ** යන විභක්ති පද පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

1. එළුවන්ගෙන්, අඟනට, අසුනෙන්, ඇතාගේ
2. අඟනට, ඇතාගේ, එළුවන්ගෙන්, අසුනෙන්
3. ඇතාගේ, එළුවන්ගෙන්, අඟනට, අසුනෙන්
4. අසුනෙන්, ඇතාගේ, අඟනට, එළුවන්ගෙන්
5. එළුවන්ගෙන්, ඇතාගේ, අඟනට, අසුනෙන් (.....)

1.19 **ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය** තෝරන්න.

1. අනුගාමිකයන් නොහොත් නායකයා එය සිදු කළේ ය.
2. පර සතුරෝ එති එති යන බසටා.
3. පියෙකු බඳු ගුරුතුමා දිළිඳු සිසුන් රැක බලා ගත්තේ ය.
4. අපි මේ වැඩය කළ යුතු ය.
5. මල්ලී ද තෝ ද මම ද එහි ගියහ. (.....)

1.20 වඩාත් ම නිවැරදි විකෘති කථනය සහිත වාක්‍යය තෝරන්න.

1. "මෙතනින් එළියට යන්න" යි තාත්තා ඔහුට දැන්වී ය.
2. "මම ගමට යමි" යැයි රසිඳු කීවේ ය.
3. "නුඹ රටින් බැහැර නො යා යුතු ය" යි නඩුකාරයා තරුණියට කීවේ ය.
4. තමා එදින පැමිණෙන බව විදුහල්පතිට කියා ඇති වග දෙමවුපියෝ කීහ.
5. "සක් දෙවියනි, මාහට පිහිට වන්න" යි බැතිමතා අයැද සිටියේ ය. (.....)

හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය | 71 | S | II

Homagama Central College

ප්‍රථම වාර පරීක්ෂණය - 2026 මාර්තු

සිංහල II | 13 ශ්‍රේණිය (2024-2026) | කාලය පැ ය 03 යි.

පන්තිය .......................................... නම/විභාග අංකය ........................................................

උපදෙස් ඃ- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

02 (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පුස්කොළ පොත් ලිවීම ලක්දිව පන්සල් අධ්‍යාපනයේ කොටසක් විය. සිංහල අකුරුවල හැඩය මෙන් ම කලාත්මක ස්වරූපය සකස් වීම කෙරෙහි පුස්කොළ අකුරු විශාල බලපෑමක් ඇති කළේ ය. මුල්කාලීන සිංහල සෙල් ලිපි අකුරු පසුකාලීනව, එනම් ක්‍රි.ව හත්වන සියවසින් පමණ පසුව, වටකුරු හැඩයක් ගැනීමට පුස්කොළ පොත්වල අකුරු බල පෑ බව මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය පී. ඊ. ඊ ප්‍රනාන්දු ආදී විද්වතුන්ගේ මතය යි. කෝණාකාර සහ තිරස් අක්ෂර රූප තල්පත මත ලිවීමේ දී පත්හිඳේ තියුණු බවත් තල්පත පහසුවෙන් ඉරී යෑමට ඇති ඉඩකඩත් නිසා සිංහල අකුරු වටකුරු ස්වරූපයක් අනුව ලියවිණ. ලිවීමේ දී ඇති වූ එම වෙනස්කම් අනුව සිංහල පුස්කොළ පොත්වල ලියන ලද අකුරු විවිධ හැඩවලින් යුක්ත විය. සෙල් ලිපියක මෙන් නොව පුස්කොළයක ලිවීමේ දී වඩාත් නිදහස් ලෙස අකුරු ලිවීමට හැකිවීම ඊට හේතුව යි. පත්හිඳෙන් ලිවීමේ දී තමන්ට හුරු අකුරුවලින් පුස්කොළවල ලිවීමේ අවස්ථාව ලේඛකයන්ට හිමි වූ අතර රූපික වෙනස්කම් අනුව සිංහල පුස්කොළ අකුරුවල තුන් ආකාර වර්ගීකරණයක් හඳුනාගත හැකි ය. රුහුණේ භාවිත වූ කොන් සහිත අකුරු මුළුකුරු නමින් ද මායා රට භාවිත වූ අකුරු වටකුරු අකුරු ගජකුරු නමින් ද පිහිටි රට භාවිත වූ අකුරු අණ්ඩාකාර අකුරු සිහකුරු ලෙස ද හඳුන්වා ඇත. මේ වර්ගීකරණය සිංහාක්ෂර, ගජාක්ෂර, හා හංසාක්ෂර ලෙස ද දක්වා ඇත. මේ අක්ෂර ශෛලිය අනුව කිසියම් පළාතකට අයත් පුස්කොළ පොතක් හඳුනාගත හැකි ය. මේ අනුව සිංහල පුස්කොළ අකුරුවල ප්‍රාදේශික විවිධත්වයක් මෙන් ම ගුරුකුල වෙනස්කම් ද දක්නට ලැබුණු බව පෙනේ. පුස්කොළයේ වමේ සිට දකුණට අකුරු ලිවීම සිදු වූ අතර සෙල් ලිපිවල මෙන් ම පුස්කොළ පොත්වල ලිවීමේ දී පද බෙදීමක් සිදු නොවිණි.

(අ) මේ ඡේදයෙන් අදහස් කරන ප්‍රධාන තේමාව කුමක් ද?
(ආ) පසුකාලීනව සෙල් ලිපි අකුරු වටකුරු හැඩයක් ගැනීමට බල පෑ ප්‍රධාන සාධකය කුමක් ද?
(ඇ) මුල්කාලීන සෙල් ලිපිවල භාවිත අක්ෂර වර්ග හඳුන්වා ඇති නම් මොනවා ද?
(ඈ) තල්පතෙහි ලිවීමේ දී අකුරු වටකුරුවීමට බල පෑ හේතු මොනවා ද?
(ඉ) රූපික වෙනස්කම් අනුව තුන් සිංහලයේ භාවිත අක්ෂර වර්ග වෙන වෙන ම දක්වන්න.
(ඊ) පුස්කොළ පොත්වල අක්ෂර ශෛලීන්හි වෙනස්කම් ඇතිවීමට බල පා ඇති හේතු මොනවා ද? (ලකුණු 12 යි)

02 (ආ) පහත සඳහන් ඡේදය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

අධ්‍යාපන ක්‍රම මුළුමනින් ම සකස්වි යුත්තේ අනාගතය හා වෙනස්වීම් පදනම් කරගෙන ය. අධ්‍යාපන ක්‍රමයක් අද ලොවට මෙන් ම ඉදිරි ලොවටත් නම්‍ය වන අන්දමින් සකස් කිරීම අවශ්‍ය කාර්යකි. තවත් වසර විසිපහක් සඳහා අවශ්‍ය වන කරුණු මේ මොහොතේ සිට සැලසුම් කළ යුතුව තිබේ. සමාජ හා තාක්ෂණික වෙනස්වීම් නිසා මිනිසුන් මෙන් ම තරුණ පෙළ ද වහා වෙනස්කම්වලට ලක්වෙති. අනාගත ඉගෙනුම් අවශ්‍යතා හැඩ ගැසෙනුයේ තරුණ අවශ්‍යතා අනුව ය. අධ්‍යාපනය විෂය මූලික වන්නේ ද නැතහොත් අධ්‍යාපනය සමාජ ගැටලු මූලිකව ක්‍රියා කරන්නේ ද යන්න පිළිබඳ තීරණාත්මක විය යුතු ය. ගැටලුවලින් පිරිපුන් නව සමාජය සඳහා අධ්‍යාපනය සුනම්‍ය විය යුතු ය. අනාගත අධ්‍යාපනය දැනට වඩා සිසුන්ට සම්පතක් වීම අත්‍යවශ්‍ය වෙයි. එබැවින් විසිඑක් වන සියවස තුළ සංවර්ධනය වන අධ්‍යාපනය වඩාත් අර්ථවත් එකක් වීම තීරණාත්මක සාධකයක් වෙයි. පාසල එහි ප්‍රධාන තීරකයා වෙයි. තරුණ පෙළ හා අනාගත සමාජය සඳහා පාසල සූදානම් කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ විමසිලිමත් විය යුතු ය. විසිඑක් වන සියවසේ පාසල පැරණි පාසල මෙන් නොව සියලු ම සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදෙන ස්ථානයක් විය යුතු ය.

සිසුන්ගේ හා තරුණ පෙළෙහි තත්ත්වයන්, සිතුම් පැතුම්, හැසිරීම් හා ක්‍රියාදාමයන් ආදිය ශීඝ්‍රලෙස වෙනස් වෙයි. මෙම තරුණ පෙළ හා ඔවුන්ගේ වෙනස්වන ගති ලක්ෂණ, පවතින පාසල් ක්‍රියාදාමයට නොගැළපෙයි. එමෙන් ම පාසලින් ඉවත්ව යන සිසුන්ගේ දිවිපැවැත්ම සඳහා ඉතා සුදුසු වාතාවරණයක් පාසලින් නොලැබීම නිසා ඔවුහු රැකියා වියුක්තිකයින් බවට පත්වෙති. මේ නිසා විසිඑක් වන සියවසයෙහි දරුවන්ගේ දිවිපැවැත්ම සඳහා දායකවීමට නම් පාසල විවිධ ආයතන සමග සහයෝගීව හා තරගකාරීව ප්‍රවේශවීම සිදුකළ යුතු ය. (ලකුණු 13 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(අ) ලෝකයෙහි රටවල් අතර පවතින යුදමය තත්ත්වයන් හා ලෝක බලවතුන්ගේ මැදිහත්වීම.

(ආ) 21 වන සියවසට සරිලන පරිදි ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ප්‍රතිපත්තීන්හි සිදුවිය යුතු වෙනස්කම්

(ඇ) කෘත්‍රිම බුද්ධි හෙවත් AI තාක්ෂණය (Artificial Intelligence) හා අනාගත ලෝකය

(ඈ) භෞතික පරිසරය මෙන් ම පුද්ගලයා තුළ සංකල්පීමය පරිවර්තනයක් සිදුකිරීමෙන් පමණක් වංචාවෙන් දූෂණයෙන් තොර අනාගත පිරිසිදු ශ්‍රී ලංකාවක් ගොඩනැඟිය හැකිය.

(ඉ) නව ව්‍යවසායකත්ව, නව නිර්මාණ හා නවෝත්පාදන තුළින් සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනගමු.

(ඊ) මානව ක්‍රියාකාරකම්හි ඍජු බලපෑම නිසා වර්ධනය වන බෝවන හා බෝ නොවන රෝග වළක්වා නිරෝගිමත් මානව පරපුරක් ගොඩනගමු. (ලකුණු 25 යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. දෙවන පැරකුම් රජු සාහිත්‍ය ග්‍රන්ථ රචකයෙකු විය.
ii. පරාර්ථකාමී සත්පුරුෂයෝ බෝධිසත්ත්වවරු මෙන් ලොවට සේවය කරති.
iii. සිංහයා විසින් හාවෙකු හා මුවෙක් දඩයම් කර ගන්නා ලදහ.
iv. අපි විභාගයෙන් සමත් වෙති යි ගුරුවරු සිතූහ.
v. දක්ෂ කථිකයා ද ගුරුවරයා ද උදෑසන රැස්වීමේ දී අදහස් දැක්වූහ.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. වැද්දා සාවා ද මුවා ද මරයි.
ii. විශ්වවිද්‍යාලය ශිෂ්‍යයෝ දේශකයාගේ අදහස් අවධානයට ලක් කළහ.
iii. දාසිය සහ දැරිය මල් නෙලති.
iv. වෑත්තෑවේ හිමියෝ ගුත්තිල කාව්‍යය රචනා කළාහු ය.
v. සංචාරකයා ගෙහිමියන් විමසුවේ ය.

(ඇ) නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. වනජීවී (නිලධාරීහු/නිලධාරීන්) වන සංරක්ෂණය සඳහා (ගම්වැසියෝ/ගම්වැසියන්) යොමුකළහ.
ii. දක්ෂ (ගායිකාවක්/ගායිකාවක) වේදිකාවේ ගී ගයතොත් (රසිකයෝ/රසිකයන්) සතුටු වනු ඇත.
iii. (පැරණි සේවකයන්/පැරණි සේවකයෝ) විසින් (නවක සේවකයෝ/නවක සේවකයන්) පිළිගැනෙති.
iv. අක්කා හා අයියා සමඟ (මා/මම) ද සාදයට සහභාගී (වීමු /වීමි ).
v. (ජාවාරම්කරුවන්/ජාවාරම්කරුවෝ ) පරිසරය විනාශ කරද්දී (දේශපාලකයෝ/දේශපාලකයින්) නිලධාරීන්ට කෑගසති. (ලකුණු 5×3=15 යි)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

i. දෙවියන් **පරසතු මලින්** (පරසතු මලින් - විභක්ති) බුදුන් **පුදද්දී** (පුදද්දී - ක්‍රියා) තමා **වනමල්** (වනමල්- සමාස) පුදන බව ගුත්තිල කතුවරයා කීවේ ය.
ii. **නූතන** (නූතන - තද්ධිත) කවියා රසිකයාගේ **බුද්ධීන්ද්‍රිය** (බුද්ධීන්ද්‍රිය - සන්ධි) **මෙන්** (මෙන් - නිපාත) ම භාවේන්ද්‍රිය ද අවදි කිරීමට සමත් විය.
iii. සිරි ගුණසිංහයෝ **අභිනිෂ්ක්‍රමණය** (අභිනිෂ්ක්‍රමණය - උපසර්ග) **කළ** (කළ - කෘදන්ත) සිද්ධාර්ථ **ගෞතමයන්ගේ** (ගෞතමයන්ගේ - විභක්ති) සිතුවිලි කවියට නැඟුහ.
iv. අලුත් මල් **මලසුන** (මලසුන - සන්ධි) මත **තබා** (තබා - ක්‍රියා) **පරමල්** (පරමල් - සමාස) නොපාගා ඉවත් කරන්නැයි උවසුවෝ කීවාහු ය.
v. **අත්‍යුදාර** (අත්‍යුදාර - උපසර්ග) සේවයක් කලාව **උදෙසා** (උදෙසා - නිපාත) සිදුකළ විශිෂ්ටතම (විශිෂ්ටතම - තද්ධිත) කලාකරුවෙකු ලෙස ඔහු ඇගයීමට ලක්විය. (ලකුණු 3×5=15 යි)

PAST PAPERS WIKI



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

06. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන්වලට වඩාත් ම ගැලපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

i. වැසි වැසීමෙන් ගලන දිය .................. නිසාවෙන් කුඩා දිය ඇලි තැනින් තැන දැකිය හැකි ය.

ii. අංගුලිමාල හිමියන්ගේ සත්‍යක්‍රියාව වූ අංගුලිමාල .................. දේශනය නිසා අද ද මව්වරු පිහිට ලබති.

iii. ධාරාණිපාත වර්ෂාවෙන් ඇදහැළුණු ජල .................... වැව් අමුණු සිඳ බිඳ දැමී ය.

iv. .................. දෙසුම සඳහා භික්ෂූන් වහන්සේ දස නමක් වැඩම කළහ.

v. 'විශ්වාසය' සදාතනික ..................ධර්මය ආරක්ෂා කරන ප්‍රබලතම සාධකය වේ.

vi. ඇගේ .................. දම නිසාවෙන් ඔහු යහපත් පුද්ගලයෙකු බවට පත්විය.

(මිතු, මිත්‍ර, පිරිත්, පරිත්‍රාණ, දහරා, ධාරා) (ලකුණු $^1/_2 \times 6 = 3$ යි)

(ආ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කොට ද සන්ධිපද විසන්ධි කොට ද ලියන්න.

i. අඹ+පාර

ii. සුළු+ඇඟිල්ල

iii. චන්ද්‍ර+උදය

iv. අභ්‍යවකාශ

v. ජාතිකානුරාග

vi පුනරුක්ති

(ලකුණු $^1/_2 \times 6 = 3$ යි)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්තිය නම් කරන්න.

i. **අලි බලන්නා** **හෙණ්ඩුවෙන්** අලියා මෙල්ල කරගනියි.

ii. **පොලොන්නරුවෙහි** ඇති සඳකඩපහණින් හෙළ කලාකරුවා **ගවයාගේ** රූපය ඉවත්කොට ඇත.

iii. අම්මා විහාරයට ගොස් **දානය පිණිස** කිරිහර පුදා **විහාරයෙන්** නික්මී පැමිණියේ මහත් ශ්‍රද්ධාවෙනි.

(ලකුණු $^1/_2 \times 6 = 3$ යි)

(ඉ) පහත සඳහන් ඡේදය සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

"මොන හොඳක් ද උන් කවුරුත් කැමතියි අපට වරදිනවා බලන්න. "එහෙනම් ඕක ඔය දෙන්නගේ ම කතාවෙන් කරපු වැඩක් " නෝනේ අනේ නෝනෙ, පිං අයිති වෙයි ඔතනින් බහින්ඩ. ඔහොම්ම. ඔහොම ඉංඩ බෑ... අයියෝ ඇයි තේරෙන්නෙ නැද්ද?

(ලකුණු $^1/_2 \times 6 = 3$ යි)

(ඊ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථන විකෘති කථනයට හරවා ලියන්න.

1. "මම මේ ආයතනය වංචාවෙන් දූෂණයෙන් මුදවා ගනිමි" යි නවකළමනාකරු පැවසුවේ ය.

2. "දරුවෝ උත්සාහයෙන් හා කැපවීමෙන් පාඩම් කළයුත්තාහ "යි ගුරුවරු අවවාද කළහ.

3. "විදුහල්පතිතුමනි, කෙසේ හෝ මාගේ දරුවා විභාගයට දමන්න යි මවක් ඉල්ලා සිටියා ය.

(ලකුණු $1 \times 3 = 3$ යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කවියා **අභිනව** ආකාරයකින් ලෝකය දකින්නෙකි. ඔහු සිය නිර්මාණ මගින් රසිකයා හමුවේ චිත්‍රණය කරන්නේ කිසියම් **ජීවිතානුභූතියක** පෙර නොවූ විරූ දර්ශනයකි; පැතිකඩකි. සෑම ශ්‍රේෂ්ඨ ගණයේ කාව්‍ය නිර්මාණයක් ම **අපූර්ව** වස්තුවක් සේ රසිකයාට හැඟී යන්නේ කවියාගේ ප්‍රකාශනය තුළ ඇති නව්‍යත්වය නිසා ය. **රසිකයා** එයින් චමත්කාරය අත්විඳී. කාව්‍යාස්වාදය යනු මේ චමත්කාරය ග්‍රහණය කරගැනීම ය. කාව්‍ය සේවනයෙන් එකී රසය චමත්කාරය අත්විඳ ගැනීමෙන් ඔබ්බට ගිය ප්‍රයෝජන කාව්‍යයෙහි තිබේ ද යනු ඉතා වැදගත් ප්‍රශ්නයකි. ඇත්ත වශයෙන් ම **රසයට** චමත්කාරයට අතිරේක වූ ප්‍රයෝජන තිබේ. තිබිය යුතු ද වේ. එකරුණ මදක් පහදාලීම වටී. ක්‍රීඩා තරගයක් සර්කස් හෝ මැජික් සන්දර්ශනයක් නැරඹීම සන්තුෂ්ටිදායක අත්දැකීමකි. එයින් ආස්වාදයක් ලැබේ. එය විනෝදය අරමුණු කර ගැනුණු **ආස්වාදයකි.** දැකුම්කලු පරිසරයක සිහිල් සෙවණලු **සහිත** වෘක්ෂලතාදියෙන් ද උද්‍යානයක සුපිපි සුවඳැති පුෂ්පාවලියෙන් ද දෙසවන් පිනවන සියොත් ගී **රාවයෙන්** ද තවත් **ආකාරයක** ආස්වාදයක් අපි භුක්ති විඳිමු. උදා කල සූර්යෝදය මෙන් ම සන්ධ්‍යාවෙහි චන්ද්‍රෝදය ද අප සිත් අලවයි; නළවයි. මේ විවිධාකාර දේ මගින් මිනිසා ආස්වාදයක් ලබයි. එහෙත් එයින් ලබන ආස්වාදයට වඩා කාව්‍යය නැතහොත් පොදුවේ සාහිත්‍ය මගින් අත්විඳින ආස්වාදය අර්ථ සම්පන්න ය.

1. ඡේදයෙහි **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස්කර ලියන්න.
2. දැකුම්කලු, අතිරේක, විවිධාකාර යන වචන තුනෙහි යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
   i. අන්තඃස්ථාක්ෂර අකුරු හතරක් යෙදී ඇති වචනයක්
   ii. සඤ්ඤක අක්ෂර සහිත වචන දෙකක්
   iii. ඌෂ්මාක්ෂර දෙකක් හා මූර්ධජ මහප්‍රාණ අක්ෂරයක් පිළිවෙළින් යෙදී ඇති වචනයක්
4. පහත සඳහන් සන්ධිපද විසන්ධි කොට දක්වන්න.

   ජීවිතානුභූතිය      සූර්යෝදය      කාව්‍යාස්වාදය
5. පහත සඳහන් ව්‍යාකරණ ප්‍රභේදයට උදාහරණ වචනයක් බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

   අවධාරණාර්ථ නිපාත,      උපසර්ග සහිත පද,      තද්ධිත පද

(ලකුණු 3×5=15 යි)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. අඝෝෂ අක්ෂර

ii. අව්‍යය සමාසය

iii. සර්ව නාම පද

iv. ගෞරවාර්ථ තද්ධිත

v. ආශිර්වාද ක්‍රියා

(ලකුණු 5×3=15 යි)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources